# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ (DTTB) ව්‍යාපෘතිය

JICA

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

JICA ආයතනය අරමුදල් සපයනු ලබන භෞමික රූපවාහිනී විකාශනය ඩිජිටල්කරණය කිරීමේ (DTTB) ව්‍යාපෘතියට පහත සඳහන් තනතුරු සඳහා 'කොන්ත්‍රාත් පදනම මත' ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා රාජ්‍ය/පෞද්ගලික අංශයේ සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම බඳවා ගැනීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) චක්‍රලේඛ අංක 01/2019 සහ රජයේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිවලට අනුව සිදු කෙරේ. ඉහත සඳහන් MSD චක්‍රලේඛයේ 03 වන වගුවේ හය වන තීරුවේ එක් එක් තනතුර සඳහා වැටුප සඳහන් කර ඇත.

අයදුම්කරුවන් වයස අවුරුදු 54 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය, රජයේ නීති රීති පිළිබඳ අවබෝධය සහ පරිගණක සාක්ෂරතාවය අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතා වේ. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල සේවය කර ලබා ඇති සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

| අංක | වැටුප් මට්ටම / කාණ්ඩය | තනතුර | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | PS 3 | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 |
| 02 | | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (ගිණුම්කරණ) | 01 |
| 03 | | සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (අධීක්ෂණ සහ ඇගයීම්) | 01 |
| 04 | PS 6 | තාක්ෂණික නිලධාරී | 02 |
| 05 | | ව්‍යාපෘති ලේකම් | 01 |
| 06 | | ව්‍යාපෘති නිලධාරී | 02 |
| 07 | සහායක කාර්ය මණ්ඩලය | කළමනාකරණ සේවා නිලධාරී | 02 |
| 08 | | රියදුරු | 02 |
| 09 | | කාර්යාල සහකාර | 01 |

එක් එක් තනතුර සඳහා වැඩිදුර තොරතුරු **www.media.gov.lk** වෙතින් ලබා ගත හැක.

ඉහත අවශ්‍යතා සපුරාලන අයදුම්කරුවන් තම ජීව දත්ත අයදුම්පත සමග ආවරණ ලිපියක්, සුදුසුකම් සහ පළපුරුද්ද සනාථ කරන ලේඛනද සමඟ 2025 ජුනි 11 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ලිපිනයට එවිය යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය. ඉහත සඳහන් කළ ලේඛන වල මෘදු පිටපත් **pddttb@media.gov.lk** වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**භෞමික රූපවාහිනී විකාශනය අංකිත කිරීමේ (DTTB) ව්‍යාපෘතිය,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත,**
**පොල්හේන්ගොඩ, කොළඹ 05.**

සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.**
**2025.05.29.**